# මතකභක්ත ජාතකය

තවද එක් සමයෙක්හි බුදුරජානන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවනාරාමයෙහි වැඩවසනසේක් මතකභක්තයක් අරභයා මේ ජාතකය වදාළ සේක. එකල්හි මනුෂ්‍යයෝ එළුවන් ආදීවූ බොහෝ සත්වයන් මරා කාලක්‍රියා කළාවූ තමන්ගේ නෑයන් උදෙසා මතකභක්ත නම් වූ පරිත්‍යාගයක් කෙරෙති. භික්ෂූහු ඒ මනුශ්‍යයන් මෙපරිද්දෙන් කරන්නාවුන් දැක සර්වඥයන් වහන්සේ අතින් ස්වාමීනි. දැන් මනුෂ්‍යයෝ බොහෝ ප්‍රාණීන් ජීවිතක්ෂයට පමුණුවා මතකභක්ත නම් වූ දෙයක් දෙති, ස්වාමීනි මෙහි වැඩෙක් ඇද්දැයි විචාළසේකී. සර්වඥයන් වහන්සේ මහණෙනි. මතකභක්ත දෙම්හයි කියා කරණ ලද ප්‍රාණඝාතයෙහි කිසිත් වැඩෙක් නම් නැත. පෙරත් නුවනැත්තෝ ආකශයෙහි හිඳ ධර්මදේශනා කොට මේ මතකභක්තයෙහි ආදීනව කියා සියළු ජම්බුද්වීපවාසී සත්වයන් මේ ක්‍රියාවෙන් ඇරවූහ. දැන් වනාහී භවසං ෂේපගත හෙයින් නැවත පහළවියයි වදාරා අතීත කථාව ගෙණහැර දැක්වූ සේකී.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි වෙදත්‍රයයාගේ පාරප්‍රාප්ත වූ දිසා ප්‍රධානව එක් ආචාර්ය බ්‍රාහ්මණයෙක් මතකභක්තයක් දෙමැයි එක් එළුවකු අල්වා ගෙණ තමාගේ අතවැස්සන්ට  සගයෙනි. මේ එළුවා ගඟට ගෙණ ගොස් නාවා කර මල්වඩම් බැඳ පසඟුල්දී සරහා ගෙණ්වයි විධාන කෙළේය. ඒ මනුෂ්‍යයෝද යහපතැයි බමුණාට ප්‍රතිඥා දී එළුවා ඇරගෙණ ගඟට ගොස් නාවා කී සැටියේ සරහා ගංතෙර සිටවූහ. ඒ එළු තමා පූර්යෙහි කරණ  ලද අකුශල කර්මය ජාතිස්මරණඥානයෙන් දැක මෙබඳු වූ දුක්ඛයෙන් අද දවස් මිදෙයි සොම්නසට පැමිණෙියේ කළයක් බිඳින කලක් පරිද්දෙන් මහත්කොට සිනාසී නැවත මේ බමුණා මා මරා මා විසින් මෙතෙක් කල් මුලුල්ලෙහි විඳිදුක් ලබන්නේයයි බමුණා මා මරා මා විසින් මෙතෙක් කල් මුලුල්ලෙහි විඳිදුක් ලබන්නේයයි බමුණා කෙරෙහි කරුණා උපදවා මහතුවූ ශබ්දයෙන් හැඬුයේය. ඉක්බිත්තෙන් ඒ තරුණ පුරුෂයෝ ඔහු අතින් සබඳ එළුවානෙනි. තොපි මහත්කොට සිනාසී ඇඬුවාහුය. කවර කාරණයකින් සිනා සුනද කවර කාරණයකින් ඇඬුවාහුදැයි විචාළාහුය. තෙපි ඇම මේ කාරණය තොපගේ ආචාරීන් සමීපයෙහි දී මා අතින් විචාරවයි කියේය. මනුෂ්‍යයෝ ඒ එළුවා ඇරගෙණ ගොස් මේ කාරණය ආචාර්යය බ්‍රාහ්මණයාහට කීහ. ඒ ආචාර්යයාද මනුෂ්‍යයන් කී බස් අසා එළුවා අතින්  එළුවානෙනි. තෙපි කවර කාරණයකින් සිනාසුනු ද කවර කාරණයකින් හැඬුයේදැයි විචාළයි ඒ එළුවාද තමා පූර්වයෙහි කළ අකුශල කර්මය ජාතිස්මරණඥාණයෙන් සිහිකොට බමුණාට කීහ. බ්‍රාහ්මණයානෙනි. මම පූර්වයෙහි තොපසේම වෙදත්‍රය හදාළ වූ බමුණුව ඉපිද මතකභක්තයක් දෙමියි එළුවකු මරා දිනිමි හේ මම ඒ එළුවා මැරූ අකුශල කර්මයෙන් එකකින් උනු පන්සියයක් ජාතියෙහි ඉස්කැපිම, දුක්ඛයට පැමිණියෙමි. මේ තෙම මට කොටිප්‍රාප්තිය වූ පිරුණු ජන්සියයක් ජාති ඇති ආත්මභාවය හේ මට අද දවස් මෙබඳු වූ දුක්ඛයෙන් මිදෙමියි සොම්නසට පැමිණියෙමි.මේ කාරණයයෙන් සිනාසෙමි. අඬන්නෙම් වනාහි මම එළුවකු මරා ජාති පන්සියයක් මුළුල්ලෙහි ඉස් කැපීම් දුක්ඛයට පැමිණ අද ඒ දුක්ණයෙන් මිදෙමි. මේ බමුණා ද මා මරා මා සේම පන්සියයක් ජාතියෙහි ඉසකැපීම දුක්ඛය ලබන්නේ යයි තොප කෙරෙහි කරුණාවෙන් ඇඬීමි. කීය. එළුවානෙනි. නොබව මම තොප නොමරමියි කිය. බමුණානෙනි කුමක් කියව්ද තොප නොමැරුවත් මා විසින් අද මරණින් මිදෙන්ට නොපිළිවනැයි කීය. එළුවානෙනි. තෙපි නොබව මම තොපට රැකවල් ගෙණ තොප හා සමග ඇවිදිමියි කිය. බමුණානෙනි තොපගේ ආරක්ෂාව ඉතා ස්වල්පය මා විසින් අද මරණින් මිදෙන්නට නොපිළිවනැයි කීය. බමුණානෙනි තොපගේ ආරක්ෂාව ඉතා ස්වල්පය මා විසින් කරණ ලද අකුශල කර්මය මහත බලවතැයි කීය. බමුණෝ එළුවානන් මුදා මේ එළුවා කවර කෙනෙකුන් විසිනුත් මැරිය නොදෙම්හයි කියා තමාගේ අතවැස්සන් ඇරගෙණ ගොස් බමුණානෝ එළුවානන් හා එක්වම ඇවිදිනාහ. එළුවා බැම්මෙන් හරණ ලද්දේ එක් ගලතලයක් පිට අටගත් තන කැලයෙක්හි කර ඔසවා කොල කන්ටයයි පටන්ගත්තේය. එකෙනෙහිම ගලතලපිට සෙනක් ගැසීය.  ඉන් ගල්ලැල්ලෙක් ඉපිරගෙණ ගොස් එළුවා දික්කලා වූ  ග්‍රීවයෙහි හී හිස කැපුනේය. ඉක්බිත්තෙන් මහජනයාද එතනට රැස්විය. එකල්හි මහබෝධිසත්වයෝ ඒ ස්ථානයෙහි වෘක්ෂ දේවතාව උපන්හ. ඒ බෝධිසත්වයෝ ද මහා ජනවා බල බලා සිටියදීම දේවතානුභාවයෙන් නිරාලම්බ වූ ආකාශයෙහි ඌරුබද්ධාසනයෙන් උපලක්ෂිතව හිඳ මේ සත්වයෝ මෙපරිද්දෙන් අකුශල යෙහි විපාක දැන ප්‍රාණඝාත නොකොළෝ නම් යෙහෙකැයි මියරුවූ කටහඬින් යුක්තව ධර්මදේශනා කරන්නාහු  මෙසේ කියත්, ඒ ඒ භවයෙහි සත්වයාගේ උත්පත්තියත් ජරා ව්‍යාධි මරණ පැමිණීමත් දුක් වන්නේ යයි මෙසේ ලෝකයෙහි සත්වයෝ දන්නාහුවීනම් සත්වයෝ සත්වයකු නොමරන්නේය. ප්‍රාණඝාත කළා වූ පුද්ගලයා වනාහි අටමහනරකයෙහිත් සොළොස් ඔසුපත් නරකයෙහිත් අනෙකප්‍රකාර වූ තිරිසන් යෝනියෙහිත් ඉපිද මහදුක් අනුභව කෙරෙමින් බොහෝ කලක් සෝක කරන්නේය. මොහයෙන් මුඪ වූ සත්වයෝ අවිජ්ජාවෙන් අන්ධව මේ ආදීනව නොදැක ප්‍රාණඝාත කරන්නාහු යයි මෙසේ මහබෝසතානෝ නරක භයින් තැතිගන්වා ධර්මදේශනා කළෝය. මනුෂ්‍යයෝ ධර්මදේශනාව අසා නරක භයින් භයපත්ව ප්‍රාණඝාතයෙන් වැලැක්කාහුය. බෝධිසත්වයෝත් ධර්මදේශනා කොට මහජනයා ශිලයෙහි පිහිටුවා කම්වූ පරිද්දෙන් මියපරලොව ගියෝය. මහජනයාත් බෝධිසත්වයන්ගේ අවවාදයෙහි පිහිටා දානාදී පින්කම් කොට දිව්‍යලෝකයෙහි උපන්නාහුය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ මතකභක්ත ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි වෘක්ෂ දේවතාව ඉපිද ධර්මදේශනා කෙළෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.